# Weekly SITUATION REPORT
## Emergency Operation Centre, DISASTER MANAGEMENT CENTRE
## තත්ව වාර්තා සටහන් සතිපතා - හදිසි මෙහෙයුම් මැදිරිය

**අප්‍රේල් 15-2010 සිට අප්‍රේල් 21- 2010 දක්වා**

| |
|---|
| **2010.04.17 දින මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් උඩෝවිට ග්‍රාම නිලධාරී කොට්ඨාශය**<br><br>තද සුළඟක් නිසා නිවාස 01 ට පූර්ණ හානිද තවත් නිවාස 07 කට අර්ධ හානිද සිදුවිය |
| **2010.04.17 දින රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුවිට, කිතුල්පේ, කොස්ගල සහ බටහිර කාහේන්ගම ග්‍රාම නිලධාරී කොට්ඨාශයන්හි**<br><br>තද සුළඟක් නිසා නිවාස 10 කට අර්ධ හානිද සිදුවිය |
| **2010.04.17 දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් 154 මැටියාව ග්‍රාම නිලධාරී කොට්ඨාශය**<br><br>අකුණුසැර වැදීම නිසා පවුල් 01 ක පුද්ගලයින් 05 දෙනෙකු පීඩාවට පත්ව ඇති අතර එම නිවසේ වයස අවුරුදු 53 ක පුද්ගලයෙකු දිය නෑමට වැවට ගොස් සිටි අවස්ථාවේදී අකුණුසැර වැදී මරණයට පත්විය. |
| **2010.04.18 දින කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 658 කොස්ඉන්න, යහපත්වල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ**<br><br>අකුණුසැර වැදීම හේතුවෙන් නිවාස 01 කට අර්ධ හානි සිදුව ඇති අතර පවුල් 01 ක පුද්ගලයින් 04 ක් ආපදාවට පත්ව ඇත. එක් පුද්ගලයෙකු තුවාල ලබා රෝහල් ගත කරන ලදි. |
| **2010.04.20 දින නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 476 L ලිපකැලේ ග්‍රාම නිළධාරී වසමේ ලිඳුල පොලිස් වසමෙහි**<br><br>පස් කන්දක් සේදී යාමෙන් පවුල් 26 ක් අවතැන් විය. අවතැන්වූවන් වතු සමාගම විසින් ළමා සුරැකුම් මධ්‍යස්ථානයේ රඳවා නුවරඑළිය දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධිකරණ ඒකකය විසින් අවශ්‍ය පියවර ලන්නා ලදි. |
| **2010.04.21 දින කොළඹ දිස්ත්‍රික්කයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් 553 බී මොරටුවැල්ල බටහිර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ**<br><br>දැඩි සුළං තත්වය නිසා නිවාස 56 ක ඇස්බැස්ටස් තහඩු 369 ක් පමණ සුළඟට ගසාගෙන ගොස් ඇත. නිවාස 56 ක පුද්ගලයින් 350 ක් පමණ පීඩාවට පත්විය. |
| **2010.04.21 දින බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩදුම්පේ ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ**<br><br>අකුණුසැර වැදීම හේතුවෙන් පවුල් 08 ක් ආපදාවට පත්ව ඇති අතර ඒ හේතුවෙන් එක් ළමයෙක් රෝහල් ගත කරන ලදි. |
| **2010.0420 සහ 2010.04.21 දෙදින මතුගම ප්‍රා.ලේ.කොට්ඨාශයට අයත් 793 වැලිපැන්න බටහිර හා 793 ඒ වැලිපැන්න නැගෙනහිර දකුණ යන ග්‍රාම නිලධාරී වසම්**<br><br>අධික වර්ෂාව නිසා පවුල් 35 ක් පමණ පිඩාවට පත්විය. මතුගම හොරවල හරහා අළුත්ගම මාර්ගයේ වැලිපැන්න ප්‍රදේශය හා මතුගම -සිට යටදොලවත්ත හරහා අළුත්ගම මාර්ගයේ සොල්දර කඩේ මැණික්ගොඩ හා ලෙව්වන්දුව අවිත්තාව මාර්ගය හා පහත් බිම් ජලයෙන් යටවීම හේතුවෙන් ගමනාගමනයට අවහිර සිදුවිය. වැසි ජලයෙන් අවතැන්වූ පවුල් සඳහා පිසූ ආහාර ලබාදීමට ප්‍රාදේශිය ලේකම් කාර්යාලය කටයුතු කර ඇත. |